රාජ්‍ය පරිපාලන චක්‍රලේ“ අංක:  17/92

මගේ අංකය:1/543ඊ814 ඩී
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1    1992 මාර්තු මස 24 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්රුන්,
ආණ්ඩුවේ ඒජන්තවරුන්, දපාර්තමේන්තු ප්‍රධානීන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ලේකම්වරුන් සහ
රාජ්‍ය සංස්ථාවල, රජයට අයත් ව්‍යාපාරික ආයතනවල
සභාපති /  නිසි බලධාරීන් වෙත.

**රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්වලට බලපාන සාමාන්‍ය රෙගුලාසිවලට ව්‍යාතිරේක - ත්‍රස්තවාදීන්ගේ බලපෑමට ලක් වූ පවුල්.**

අංක. 49/91 හා 1991 ඔක්තෝබර් මස 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ඉවත් කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය ආදේශ කරනු ලැබේ.

02. රාජ්‍ය සේවාවට, පළාත් රාජ්‍ය සේවාවට, රාජ්‍ය සංස්ථාවලට, රජයට අයත් ව්‍යාපාරික ආයතනවලට සහ රජයට හෝ රාජ්‍ය සේවා ආයතනවලට කොටස්වලින් 51% ක් අයත් සමාගම්වලට නිලධාරීන් / සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාගයකට පෙනී සිටින ත්‍රස්තවාදීන්ගේ බලපෑම්වලට ලක් වූ පවුලක එක් සාමාජිකයෙකුට පහත දැක්වෙන අවස්ථා එකක් හෝ කිහිපයක් හෝ ඇත්නම් පහත දැක්වෙන සහන සැලසිය යුතු යයි තීරණය කර ඇත.

| | | **සහනය** |
|---|---|---|
| (I) | පියා හෝ මව මරා දමා ඇති විට | 25% |
| (II) | සැමියා හෝ බිරිය මරා දමා ඇති විට | 25% |
| (III) | පවුලට ආධාර කළ සහෝදරයා හෝ සහෝදිරිය මරා දමා ඇති විට | 25% |
| (IV) | දේපළ සම්පූර්ණයෙන්ම විනාශ කර ඇති විට | 20%. |
| (V) | ඉහත (I) , (II ), ( III) යටතේ දක්වා ඇති ඕනෑම පුද්ගලයකු ස්ථිර සහ සම්පූර්ණ බෙලහීනතාවට පත්ව ඇති විට | 25% |

| | | |
|---|---|---|
| (VI) | ඉහත (I) , (II ) හෝ ( III) යටතේ දක්වා ඇති ඕනෑම පුද්ගලයකු ස්ථිර අර්ධ බෙලහීනතාවටපත්ව ඇතිවිට | දුබලතාවේ/ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය පදනම් කරගෙන 25% ලකුණු වලින් ගණන් බැලූ අනුපාතික ප්‍රමාණය. |

<u>**සටහන් :**</u>

(අ) මෙම සහනදායී ලකුණු සියයට ප්‍රමාණ ගණන් බැලීමේ පදනම වන්නේ විභාගයේ දී අපේක්ෂකයා ලබාගත් මුළු ලකුණු ගණන වේ.

(ආ) ඉහත දක්වෙන අවස්ථා කිහිපයක් ඇති විට වඩාත් වාසිදයක අවස්ථාවට ලැබෙන ලකුණු ප්‍රමාණය පමණක් ප්‍රදනය කළ යුතුය.

(ඇ) පවුලේ එක් සාමාජිකයකුට වැඩි සංඛ්‍යාවක් මරා දමා ඇති විට අමතර ලකුණු 10 ක් එකතු කළ යුතුය.

(ඈ) මෙවැනි ත්‍රස්තවාදී බලපෑමට ලක් වූ පවුලක එක් සාමාජිකයෙකුට පමණක් මෙම සහනය සීමා කළ යුතුය.

(ඉ) ඉහත (V) හෝ (VI) යටතට වැටෙන බලපෑමට ලක් වූ පුද්ගලයා එවැනි ශාරීරිකතුවාල පිළිබඳව ප්‍රාදේශීය සෞඛ්‍ය, සේවා අධ්‍යක්ෂවරයාට වාර්තා කළ යුතුය. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා තුවාල වර්ගීකරණය සඳහා සහ බෙලහීනතාව/ ඉපයීමේ ශක්තිය හීනවීම තීරණය කිරීම සඳහා වෛද්‍ය මණ්ඩලයක් පත් කරනු ඇත.

(ඊ) තව ද, බලපෑමට ලක් වූ පුද්ගලයා එවැනි ශාරීරික තුවාල පිළිබඳව පළාතේ පොලිස් ස්ථානයට ද, ප්‍රාදේශීය ලේකම්වරයාට ද/ අතිරේක දිසාපතිට ද වාර්තා කළ යුතුය. මෙම තැනැත්තා ත්‍රස්තවාදී ක්‍රියාවකින් බලපෑමට ලක් වූ පුද්ගලයකු ද යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා පොලීසිය සහ ප්‍රාදේශීය ලේකම්වරයා/ අතිරේක දිසාපතිවරයා පරීක්ෂා කර බලනු ඇත.

03. මෙම සහන අපේක්ෂා කරන අයදුම්කරු අනෙකුත් සාමාන්‍ය අයදුම්කරුවන් මෙන් බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති සියළුම අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

04. උසස්වීම්වලට හෝ සීමිත තරඟ විභාගවලට හෝ මෙම සහනය අදාළ නොවේ.

05. මෙම චක්‍රලේඛයේ කාර්ය සඳහා " පවුලේ සාමාජිකයින් " යන පදයෙන් අදහස් කරනු ලබන්නේ බලපෑමට ලක් වූ තැනැත්තා විවාහක නම්, කලත්‍රයා ද විවාහක අවිවාහක බව හෝ රැකියා සහිත රැකියා විරහිත බව හෝ නොතකමින් දරුවන් ද වන අතර, බලපෑමට ලක්වූ තැනැත්තා අවිවාහක නම් මව සහ පියාට අමතරව විවාහක අවිවාහක බව හෝ රැකියා සහිත රැකියා විරහිත බව හෝ නොතකමින් සහෝදරයින් සහ සහෝදරයින් ද වේ.

06. අතිරේක දිසාපති / ප්‍රාදේශීය ලේකම් (අ:ආ:ඒ) මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මෙවැනි එක් එක් කාරණය පිළිබඳ වාර්තා සකස් කර යාවත්කාලීන කර පවත්වා ගත යුතු වන අතර, එහි පිටපත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයා වෙත සහ ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද යැවිය යුතුය. වෙනත් පත් කිරීමේ බලධාරියකු ද ඉල්ලා සිටි විටෙක මෙම තොරතුරු ඔහු වෙත ද සැපයිය යුතුය.

07. පත්වීම් දීමට පෙරාතුව පත් කිරීමේ බලධරයා විසින් අයදුම්කරු මෙම සහන ලැබීමට හිමිකම ඇත්තේ ද යන්න ද, මීට පෙර මෙම සහනය පවුලේ සාමාජිකයකුට ලබා දී තිබේ ද යන්න ද, ප්‍රාදේශීය ලේකම් / අතිරේක දිසාපති (අ.ආ.ඒ.) වෙතින් විමසා බැලිය යුතුය. පවුලක සාමාජිකයින් කිහිප දෙනෙකු සිටින අවස්ථාවල දී ඔවුන්ගෙන් කවරකුට මෙම සහනය හිමි විය යුතු ද යන කරුණ ගැන ඔවුන් අතර, එකගත්වයකට පැමිණිය යුතු අතර, මේ බවට ප්‍රාදේශීය ලේකම් / අතිරේක දිසාපති ඉදිරියේ දී අත්සන් කළ යුතුය. පත්වීම දීමෙන් පසුව එම පවුලේ නම ත්‍රස්තවාදීන් අතින් බලපෑමට ලක් වූ පවුල් ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් / අතිරේක දිසාපති වෙත ද, (අ.ආ.ඒ) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයා වෙත ද ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද පත් කිරීමේ බලධරයා විසින් දන්වා සිටිය යුතුය. මෙම පියවර ගෙන ඇති බවට තහවුරුවක් පත් කිරීමේ බලධරයා විසින් මාසයක් ඇතුළත ලබාගත යුතුය.

08. මෙම ක්‍රමය යටතේ කරනු ලබන පත් කිරීම්, ප්‍රතිලාභීන්ගේ එක් එක් ජනවාර්ගික පංගු ප්‍රමාණය වෙනුවෙන් හිලව් කළ යුතුය.

09. මෙම යෝජනා ක්‍රමය 1990.01.01 දිනෙන් පසුව පැවැත් වූ විභාග පදනම් කරගෙන පුරප්පාඩු පුරවනු ලබන අවස්ථාවල දී අදාල වන්නේ ය. 1987 ජූලි මස 01 වැනි දිනෙන් පසුව ඇති වූ ත්‍රස්තවාදී සිද්ධීන් සියල්ල මෙම යෝජනා ක්‍රමයෙන් ආවරණය වනු ඇත.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.